**ගැටුම් වල බලපෑමට ලක්වූ ප්‍රදේශවල හදිසි අවශ්‍යතා ව්‍යාපෘතියේ ( සීඊආර්ර් ) - ඒ සංරචකය -2012**

---

**1. මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර , මාගේ මතය වනුයේ ,

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ආරම්භක හා අවසාන ශේෂ, සමාලෝචිත වර්ෂය සඳහා අග්‍රිම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වී ඇති බවත්ය.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මූල්‍ය කාර්ය සාධනය

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකිවූ තොරතුරු අනුව , 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.2,524,886,115 ක් වූ අතර 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.3,405,873,104 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම සහ ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වියදම් විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2012 | 2011 | |
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 2,291,866,077 | 512,276,155 | 2,974,027,072 |
| උපකරණ | 19,982,886 | 34,601,979 | 55,555,219 |
| උපදේශක සේවා | 151,476,107 | 106,966,105 | 261,124,897 |
| වර්ධක මෙහෙයුම් පිරිවැය | 37,655,435 | 34,144,376 | 74,833,794 |
| බැඳීම් ගාස්තු | 23,905,610 | 16,426,512 | 40,332,122 |
| | 2,524,886,115 | 704,415,127 | 3,405,873,104 |

### 2.3 අග්‍රිම අරමුදල් ගිණුම

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකිවූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් හා 2012 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ පැවති ශේෂය පහත දැක්වේ.

| | එජඩො | රු. |
|---|---|---|
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | 2,019,699 | 230,046,320 |
| එකතු කළා :- ඌන පූර්ණයන් | 4,262,042 | 557,843,952 |
| විදේශ විනිමය වාසිය | - | 11,426,422 |
| | 6,281,741 | 799,316,694 |

| | | |
|---|---|---|
| අඩු කළා - ආපසු ගැනීම් | 3,419,901 | 435,402,785 |
| | ------------- | -------------- |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | 2,861,840 | 363,913,909 |

## 3. විගණන නිරීක්ෂණ

### 3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට උතුරු පළාත් ව්‍යාපෘති කාර්යාලය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල සටහන්වල දැක්වෙන ලැබිය යුතු ශේෂ හා මල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන ලැබිය යුතු ශේෂ අතර රු.539,299 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) උතුරු පළාත සභාවේ (උපස) මූල්‍ය ප්‍රකාශන හා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අතර එකතුව රු.98,664,486 ක වෙනසක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

**ලැබීම් හා ගෙවීම් ප්‍රකාශන**

| | උතුරු පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන | ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 1,395,361,651 | 1,297,667,519 | 97,694,132 |
| උපකරණ | 20,953,240 | 19,982,886 | 970,354 |
| | 1,416,314,891 | 1,317,650,405 | 98,664,486 |

**3.2 සැලසුම් කිරීම හා අධීක්ෂණය**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළ වෙන්කරන ලද අරමුදල් යොදා ගනිමින් ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම තහවුරු කර ගනු වස්, මාසික, කාර්තුමය හා අර්ධ වාර්ෂිකව වගකීම් දක්වමින් මූල්‍ය හා භෞතික ඉලක්කයන් සහිතව සියළු ව්‍යාපෘති කාර්යයන් හා අරමුදල් ප්‍රතිපාදනය ආවරණය වන පරිදි විස්තරාත්මක ක්‍රියාකාර සැලැස්මක් සමස්ත ව්‍යාපෘති කාල පරිච්ඡේදය ආවරණය වන ලෙස පිළියෙල කළ යුතු වුවද, එවැනි සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ඉටුකර ගත යුතු ඉලක්කයන් සමඟ ප්‍රධාන කාර්ය මණ්ඩලයේ වගකීම් පැහැදිලිව ගනිමින් සහ කාලපරිච්ඡේදය තුළ සිදුකළ යුතු කාර්යයන් සම්බන්ධයෙන් අයවැයගත ප්‍රතිපාදනය සඳහා ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. එබැවින් නිවැරදි කිරීම් ක්‍රියාමාර්ග ගැනීමට සහ දක්වා තිබූ අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වෙනස් කිරීම් සිදුකිරීමට සමස්තයක් වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය විධිමත්ව ඇගයීම් කළ නොහැකි විය.

**3.3 සම්බන්ධීකරණ කාර්ය මණ්ඩලය සඳහා දීමනා ගෙවීම**

--------------------------------------------------------

2011 හා 2012 වර්ෂ සඳහා සම්බන්ධීකරණ දීමනා ලෙස රු.1,063,016 ක මුදලක් උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම්, යටිතල පහසුකම් අමාත්‍යාංශයෙ ලේකම්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - මුදල් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - සැලසුම් වෙත ගෙවා තිබුණ. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නිලධාරීන්ගේ වැටුපෙන් 1/5 ක් ගෙවීමට උතුරු පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබාගෙන තිබුණද, දීමනා ගෙවීම සඳහා අරමුදල් පළාත් සභාවේ විෂය පථයට අයත් නොවු අතර එය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ හා ආසියානු සංවර්ධන බැංකුවේ විෂය පථයට අයත් විය. එබැවින් රු.1,063,016 ක් වු දීමනා සඳහා අදාළ අනුමැතිය පළාත් සභා අමාත්‍යාංශයෙන් හෝ ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබාගෙන නොතිබුණි.

(ආ) ව්‍යාපෘති කාර්යයන් සම්බන්ධීකරණය සඳහා දීමනා ගෙවා තිබුණද, නියාමන කමිටු රැස්වීම් සඳහා පැමිණීම හැර නිම කරන ලද වැඩවල ස්වභාවය හා විස්තර , ව්‍යාපෘතියට අදාළ කාර්යයන් සඳහා නිලධාරීන් වැය කළ දින ගණන වැනි කාර්යයන් සම්බන්ධීකරණයට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) සම්බන්ධීකරණ දීමනා ගෙවීම් කරන ලද මාසික දළ වැටුප මසකට රු.50,000 ක් ඉක්මවන නිලධාරින්ගේ වැටුප් වලින් 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ XV පරිච්ජේදය ප්‍රකාරව උපයන විට ගෙවීම් බදු අයකර ගෙන නොතිබුණි.

3.4 සිවිල් වැඩ

-----------

දිස්ත්‍රික් පහත මාර්ග පිළිබඳ තෝරාගත් නියැදිවලට අදාළව සදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයට අනුව පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොකාවිල් - තුනුක්කායි කි.මී. 10 ක මාර්ගය -
මාර්ග උරහිස් පරවීමෙන් තොරව මාර්ග කි.මී 5 ක් පමණක් සම්පූර්ණ කර තිබුණු අතර ඉතිරි කි.මී. 5 ක මාර්ගය සඳහා බොරළු වැඩ පමණක් නිම කර තිබුණි.

(ආ) මුරුකන්ඩි - අක්කරායන්කුලම් මාර්ගය (කි.මී. 10 )
උරහිස් පිරවීම සම්පූර්ණ කර නොතිබුණි.

(ඇ) පෙරුම්කුලම් - වන්කත්තනයි මාර්ගය
මාර්ග උරහිස් තද කිරීම සිදුකර නොතිබුණි.

(ඇ) මීනච්චි අම්මාන් කෝවිල් මාර්ගය
මාර්ග උරහිස් තද කිරීම විධිමත්ව සිදුකර නොතිබුණි.

(ඉ) චාවකච්චේරි නගර සභා මාර්ගය
මාර්ග උරහිස් තද කිරීම සතුටුදායකව සිදුකර නොතිබුණි.

3.5 ප්‍රගති වාර්තා ඉදිරිපත් නොකිරීම

---------------------------------

උපදේශක සමාගම විසින් කාර්තුමය හා අර්ධ වාර්ෂික ප්‍රගති වාර්තා පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ දීප ව්‍යාප්ත සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගති වාර්තාව විගණනය විසින් ඉල්ලා තිබුණු නමුත් එය පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 4. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 4.1 අරමුදල් උපයෝජනය

ව්‍යාපෘති යෝජනා අනුව, ව්‍යාපෘති කාල පරිච්ඡේදය සඳහා වර්ග 6 ක් වෙනුවෙන් රු.මිලියන 9,924.2 ක මුදලක් වෙන්කර තිබුණි. කෙසේ වුවද, 2012 දෙසැම්බර් 31 දක්වා රු. මිලියන 3,406 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි. එබැවින්, ව්‍යාපෘති කාල පරිච්ඡේදයෙන් මාස 30 ක් අවසන් වීමෙන් පසුව සියයට 66 ක අරමුදල් පමණක් උපයෝජනය කර තිබුණි. 2012 දෙසැම්බර් 31 දක්වා එක් එක් වර්ගය යටතේ උපයෝජනය හා උපයෝජනය නොකරන ලද ප්‍රතිපාදන පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ගය | ණය ගිවිසුම අනුව අරමුදල් වෙන්කිරීම | 2012 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ මුදල | 2012 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය නොකළ මුදල | උපයෝජනය කළ මුදලේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| සිවිල් වැඩ | 8,933.6 | 2,974.0 | 5,959.6 | 33 |
| උපකරණ | 65.0 | 55.6 | 9.40 | 86 |
| උපදේශක සේවා | 261.3 | 261.0 | 0.3 | 99 |
| වර්ධක | 128.7 | 74.8 | 53.9 | 58 |
| බැදීම් ගාස්තු | - | 40.4 | (40.4) | - |
| වෙන් නොකරන ලද | 535.6 | - | 535.6 | - |
| | 9,924.2 | 3,405.8 | 6,518.4 | 34 |

### 4.2 මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ "ඒ" සංරචකය යටතේ කාර්යයන් පිළිබඳ මූල්‍ය හා භෞතික කාර්ය සාධනය සාරාංශ කර පහත දැක්වේ.

| | කොන්ත්‍රාත්තු අංකය | ආරම්භ කළ දිනය | නිමකළ යුතු දිනය | 2012 දෙසැ. 31 දිනට මූල්‍ය ප්‍රගතිය % | 2012 දෙසැ. 31 දිනට භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| (i) | CAREP/NPRDD/NCB/LG 9 | 2012 නොවැ. 01 | 2014 පෙබ. 01 | 8.94 | 5 |
| (ii) | CAREP/NPRDD/NCB/PL 4 | 2011 අගෝ. 25 | 2013 ජන. 25 | 32.79 | 30 |
| (iii) | CAREP/NPRDD/NCB/PL 6 | 2011 අගෝ. 25 | 2013 ජන 25 | 27.49 | 13 |
| (iv) | CAREP/NPRDD/NCB/PL 7 | 2011 සැප්. 30 | 2013 මාර්තු 02 | 71.83 | 69 |
| (v) | CAREP/NPRDD/NCB/PS 2 | 2011 අගෝ. 18 | 2013 මැයි 18 | 39.80 | 35 |
| (vi) | CAREP/NPRDD/NCB/ PS 3 | 2011 සැප්. 27 | 2012 සැප්. 27 | 64.00 | 56 |
| (vii) | CAREP/NPRDD/NCB/ PS 9 | 2011 ඔක්. 20 | 2012 ඔක්. 19 | 51.40 | 50 |
| (viii) | CAREP/NPRDD/NCB/ PS 10 | 2011 ඔක්. 24 | 2012 ඔක්. 23 | 39.00 | 30 |

## 5. පද්ධති හා පාලන

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඇ) ගෙවීම්